ආගමික අපහාසයක් සිදු කළ බවට පැවසෙන චෝදනාවක් මත පසුගිය දිනක ප්‍රහසන ශිල්පිනියක සැක පිට අත්අඩංගුවට ගැනීමේ පුවත, මාධ්‍ය තුළත්, සමාජ මාධ්‍ය තුළත් ප්‍රමුඛ අවධානයක් ලබාගැනීමට සමත් විණි. එහිදී, ඒ සම්බන්ධයෙන් වාර්තා කරනු ලැබූ ඇතැම් මාධ්‍ය විසින් එම සැක පිට අත්අඩංගුවට ගත් ප්‍රහසන ශිල්පිනිය, නීතියෙන් වැරදිකරුවෙකු හෝ නිවැරදිකරුවෙකු ලෙසින් තීන්දු කිරීමටද පෙරාතුව, වැරදිකරුවෙකු ලෙසින් දක්වමින් පුවත් වාර්තා කිරීම සම්බන්ධව Ethics Eye අපි ඔබේ අවධානය යොමු කළෙමු.

ඒ අතර, මැයි 30, 2023 දින කතුවැකිය තුළ, අරුණ පුවත්පත ද ඒ පිළිබඳ යම් යම් සඳහන් කිරීම් කොට තිබේ. ඒ මෙසේය.

"තේ‍උඩැක්කිය හිරේ දැම්මත් කල්ල මරේ නම්.." යන සිරස්තලයෙන් යුතුව එම කතුවැකිය ඉදිරිපත් කර තිබිණි.

"නිහීන තේ‍උඩැක්කිය", "කොන්ඩය පාට කර ගත්, යටි රැවුල දිගු කරගත්, වේ තොප්පි දමාගත් පිම්පියන් රැනක්" වැනි සඳහන් කිරීම් දක්නට ලැබිණි.

"ඇගේ HPD තත්වය" යන සඳහන් කිරීම් ඔස්සේ, ඇයට Histrionic Personality Disorder තත්වය තිබෙන්නට හැකි යැයි හඟවා තිබිණි.

ඔබ සිතන ලෙසට,

1) තවමත් නීතියෙන් වරදකරුවෙකු හෝ නිවැරදිකරුවෙකු බවට තීන්දුවක් ලබා නොදුන් අයෙකු සම්බන්ධයෙන්, මෙසේ කතුවැකියක් ඔස්සේම "නිහීන තේ‍උඩැක්කිය" වැනි සඳහන් කිරීම් ඔස්සේ, එම පුද්ගලයාට අවමානයක්, අගෞරවයක් සිදු නොවන්නේ ද?

2) කතුවැකියක් තුළ වන මෙවැනි අදහස් දැක්වීම් ඔස්සේ, එම සැකකරු වැරදිකරුවෙකු බවට අදහසක් සමාජගත නොවන්නේ ද? එය එම සැකකරු වරදකරුවෙකු බවට මාධ්‍ය විසින් තීන්දුවක් ලබාදීමක් (Trial by media) නොවන්නේ ද?

3) එම සැකකරුට හෝ වෙනත් අයෙකුට මානසික සංකූලතාවයක් තිබේ යැයි අරුණ කතුවැකිය නිර්ණය කරන්නේ කුමන පදනමකින් ද? එසේම, යමෙකුට මානසික සංකූලතාවයක් තිබුණද, එය පදනම් කරගනිමින් පුද්ගලයකු කොන් කිරීම කෙතරම් මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල ද?

මෙම සිදුවීමේ වාර්තාකරණයන් පිළිබඳව අප මින් පෙර ඉදිරිපත් කළ පෝස්ටුව මෙතැනින්:

https://web.facebook.com/.../a.234027673.../1950948121926902
https://web.facebook.com/.../a.234027673.../1951422098546171
https://web.facebook.com/.../a.234027673.../1951422215212826

# අපහාසයන්, අගෞරවයන් සහ පුවත්පත් කතුවැකි

## තේඋඩැක්කිය හිරේ දැම්මත් කල්ල මරේ නම්..

සිදුහත් හෙවත් සිද්ධාර්ථ යන නමෙහි අර්ථය තුන්ලෝකයකම අර්ථයක් සිදුකරන්නා යන්නය. සිද්ධාර්ථ බුදු ලොවට වැඩ සැලසූ උත්තමයකුට නිහීන තේඋඩැක්කියක් විසින් ඒ උත්තම සිද්ධාර්ථ නාමයේ ගැඹුරු අර්ථයන් සමච්චලයට ලක්කරමින් පහත් (නී)රසයක් උපදවන්නට ගන්නා උත්සහයත්, එය අසා එම වේදිකාවේ සිටින ගොන්රැළක් හිනාවෙන් තප්පුලන අයුරුත් රටක් රත් කළේය.

කොණ්ඩය පාට කරගත්, යටි රැවුල් දිගු කරගත්, වේ තොප්පි දමාගත් පිංපියන් රැනක් විසින් පෙරකී තේඋඩැක්කිය ඩිජිටල් වේදිකාවට නංවනු ලබන අරමුණු අතර අංක එකේ අරමුණ ඇගේ HPD තත්ත්වය යොදගනිමින් තම සල්ලි මල්ලට ඩොලර් හලාගැනීම විය හැකිය.

තේඋඩැක්කියත්, ඇයව විකුණන පිංපි රැනත් අත්අඩංගුවට ගෙන දඬුවම් පැමිණවීමෙන් ඔබ්බට ගොස් මෙම සටකපට ඉපැයුම් මාර්ගය අවහිර කිරීමට කටයුතු සකස්විය යුතුය.

2023-05-30